# මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

## අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු

## සහ

## ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 125740)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද පරීක්ෂණයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020.09.15 දින පැවැති මුදල් මණ්ඩල රැස්වීමේදී **"සමන් කැකුල", ඇඹලව, දෙමටළුව, කුරුණෑගල** පදිංචි / පිහිටා ඇති අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු මහතා (693041988 V) සහ ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් එකී පනතෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර සිදු කල හෝ සිදු කරන බව හෝ තැන්පත් බාර ගත් හෝ බාරගන්නා බවට තීරණය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතේ 42(10) වගන්තිය යටතේ මහජන සුහසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්;

(අ) ඉහතින් සදහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට තවදුරටත් පොරොන්දු පත්‍ර නිකුත් කිරීම හරහා හෝ වෙනත් කිසිදු ආකාරයකින් තැන්පතු බාරගැනීම සහ මුදල් ව්‍යාපාර කරගෙන යාම සිදු නොකරන ලෙසටත්

(ආ) ඉහතින් සදහන් කරන ලද පුද්ගලයා සහ සමාගම විසින් තැන්පත්කරුවන්ගේ සමස්ත තැන්පතු ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පිළිගත හැකි කාලරාමුවක් සහිත සැලැස්මක් දින 14 ක් ඇතුළත මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසටත්

විධාන කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සදහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට කිසිදු ආකාරයකින් තැන්පතු හෝ මුදල් කැඳවීම සහ රැස්කිරීම, වත්කම් බැහැර කිරීම / අන්සතු කිරීම, යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට හෝ සම්බන්ධ ගණුදෙනුවකට ඇතුළුවීම තහනම් කරමින්, එවැනි කටයුතු ක්‍රියාවිරහිත කිරීමේ නියෝග නිකුත් කර ඇත.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

0112477000, 0112440330, 0112330220 @ cbslgen@cbsl.lk http://www.cbsl.gov.lk